පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක :- 77

පරිසර අමාත්‍යාංශය

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119 (4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

பாராளுமன்ற வெளியீட்டுத் தொடர் இலக்கம் :- 77

சுற்றாடல் அமைச்சு

பாராளுமன்றத்தின் அரச கணக்குக் குழுவினால் முன் வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119 (4) இன் கீழ் கௌரவ அமைச்சரின் அவதானிப்புக்களும் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்.

Parliamentary Series No :- 77

Ministry of Environment

Submission of observations of Hon. Minister and steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms of Standing Order No.119(4)

<u>රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තා සම්බන්ධයෙන් නිරීක්ෂණ හා ගෙන ඇති ක්‍රියාමාර්ග ඉදිරිපත් කිරීම - පරිසර අමාත්‍යාංශය</u>
<u>පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 77</u>

	කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු/ කමිටුව විසින් ලබා දී ඇති නියෝග	අඩුපාඩු නිවැරදි කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග/ නිර්දේශ ක්‍රියාත්මක කිරීම/වර්තමාන තත්වය
01.	සායනික අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ක්‍රියාකාරී සැලැස්ම 2019 ඔක්තෝබර් 01 දින සිට බලාත්මක වන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සහ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ 2022.03.25 දෙන ලද නිර්දේශය ප්‍රකාරව සායනික අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ක්‍රියාකාරී සැලැස්මේ වර්තමාන තත්වය, අදාළ සියළු රාජ්‍ය ආයතන සම්බන්ධීකරණය කර ගනිමින් අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ඒකාබද්ධ යාන්ත්‍රණයක් ඇති කර තිබේද යන්න පිළිබඳවත් කාරක සභාව විමසීය.	අපද්‍රව්‍ය කළමනාකරණ පිලිබඳ ජාතික ප්‍රතිපත්තිය නිසියාකාරයෙන් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අධීක්ෂණය සඳහා පරිසර අමාත්‍යාංශයේ ලේකම්ගේ සභාපතීත්වයෙන් යුතු කමිටුවක් පත් කර ඇති අතර ජාතික ප්‍රතිපත්තියෙහි එක් එක් අපද්‍රව්‍ය කාණ්ඩය සඳහා හඳුනාගෙන ඇති ප්‍රධාන පාර්ශවකාර ආයතන. මෙම කමිටුවේ සෙසු සාමාජික ආයතන ලෙස ක්‍රියා කරයි. ඒ අනුව, එම ආයතන විසින් අදාළ අපද්‍රව්‍ය කාණ්ඩය සඳහා ජාතික ප්‍රතිපත්තියට අනුකූලව සිදු කරන ක්‍රියාකාරකම් සඳහා කෙටි කාලීන (2023-2024), මධ්‍ය කාලීන (2025-2026) හා දිගු කාලීන (2027-2030) ලෙස කාල රාමු සහිතව ක්‍රියාකාරී සැලසුම් පිළියෙළ කොට ඇත. මෙම සැලසුම් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය උක්ත කමිටුව වෙත කාර්තුමය වශයෙන් ඉදිරිපත් කරනු ලබයි. මෙහිදී අදාළ රාජ්‍ය ආයතන සතුව මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණවත් පරිදි නොමැති වීම එම ක්‍රියාකාරී සැලසුම් සාර්ථකව සිදු කිරීමට බාධාවක් වී ඇත.
06.	කසල කළමනාකරණය නිසි ලෙස අධීක්ෂණය කිරීම.	මධ්‍යම පරිසර අධිකාරියේ උපද්‍රවකාරී අපද්‍රව්‍ය හා රසායනික ද්‍රව්‍ය කළමනාකරණ ඒකකය හා සිසිලි හනාරෝ එන්කෙයා ආයතනය සමඟ සාකච්ඡා කර 2023.07.01 දින සිට සායනික අපද්‍රව්‍ය රැගෙනයාම අධීක්ෂණය සඳහා එම ආයතනයේ වාහන 09 ක් සඳහා GPS නාක්ෂණය යොදා ගනිමින් මෘදුකාංග පද්ධතියක් (GPS Tracking System) මේ වන විට ස්ථාපිත කර ඇත. එමගින් රෝහල්වල සිට සිසිලි හනාරෝ එන්කෙයා ආයතනයේ දාහකය දක්වා සායනික අපද්‍රව්‍ය රැගෙන යෑමේදී ප්‍රවාහනයට අදාල තොරතුරු එම පද්ධතිය හරහා මධ්‍යම පරිසර අධිකාරිය වෙත ලබා ගත හැක. නිර්දේශයේ සඳහන් මාස තුනක කාලය ඇතුළත් වන පරිදි අදාළ තොරතුරු මධ්‍යම පරිසර අධිකාරිය වෙත ලබා ගෙන ඇත.

		සායනික අපද්‍රව්‍ය බැහැර කිරීමට අදාළ අනෙකුත් තොරතුරු (බැහැර කළ සායනික අපද්‍රව්‍ය ප්‍රමාණය, බැහැර කිරීමේ ක්‍රියාවලියේ පරිසර සාධක සඳහා වන අනුකූලතාවය ආදී තොරතුරු) මධ්‍යම පරිසර අධිකාරිය විසින් සෘජුවම සිසිලි හන්නාරෝ එන්කෙයා ආයතනය හරහා ලබා ගැනීම ද සිදු කෙරේ.
08.	අපද්‍රව්‍ය ඉවත්කිරීමට යොදා ගන්නා ඇසුරුම් ප්‍රමිතියෙන් තොර බව	මධ්‍යම පරිසර අධිකාරිය විසින් උපලේඛණගත අපද්‍රව්‍ය කළමනාකරණ බලපත්‍ර නිකුත් කිරීමේදී සිදු කරන ක්ෂේත්‍ර පරීක්ෂණ වලදී, අදාල රෝහල් හා සෞඛ්‍ය ආයතන විසින් නිවැරදි වර්ණ සහිත බහාලුම්තුලට සායනික අපද්‍රව්‍ය නිසි පරිදි වෙන් කර මනා ආරක්ෂිතව බැහැර කිරීම් නිසි පරිදි සිදු කරන්නේද යන්න අධීක්ෂණය කරනු ලබයි. ඒ අනුව සායනික අපද්‍රව්‍ය බැහැරකිරීම සඳහා කහ පැහැති බහාලුම් කවර හා රතු පටිය සහිත කහ පැහැති පෙට්ටි එම අදාල රෝහල් /සෞඛ්‍ය ආයතන මඟින් යොදා ගන්නා බව නිරීක්ෂණය කර ඇත. මධ්‍යම පරිසර අධිකාරිය විසින් නිකුත් කර ඇති අංක 2034/33 දරණ හා 2017.09.01 දිනැති ගැසට් පත්‍රයේ ප්‍රකාශිත රෙගුලාසියට අනුව සියළු නිෂ්පාදනයන් සඳහා භාවිතාවන පොලිතීන්වල ඝනකම මයික්‍රෝන 20 ට වැඩි විය යුතුය. අදාල රෝහල්/සෞඛ්‍ය ආයතන එම බහාලුම් කවරවල ප්‍රමිතිය පවත්වා ගැනීම සිදුකර ගත හැක.
09.	කසල කළමනාකරණය සම්බන්ධයෙන් බලපත්‍ර නිකුත් කිරීම.	පරිසර ආරක්ෂණ බලපත්‍රයට අමතරව රෝහල්/සෞඛ්‍ය ආයතන මඟින් උපලේඛනගත අපද්‍රව්‍ය කළමනාකරණ බලපත්‍ර ලබා ගැනීම අනිවාර්ය කරුණක් වේ. එබැවින් මේ වන විට එම උපලේඛනගත අපද්‍රව්‍ය කළමනාකරණ බලපත්‍ර ලබා ගැනීමට අදාල දැනුවත් කිරීම් මධ්‍යම පරිසර අධිකාරිය විසින් සිදු කර ඇත. ඒ අනුව අදාල උපද්‍රවකාරී අපද්‍රව්‍ය කළමනාකරණ බලපත්‍ර ලබාදීමේ ක්‍රියාවලිය සිදු වෙමින් පවතින අතර, අවශ්‍ය අවම සුදුසුකම් හෝ සපුරා ඇති රෝහල්/සෞඛ්‍ය ආයතන සඳහා බලපත්‍ර නිකුත් කිරීම මේ වන විටත් සිදු කෙරේ.
11.	කසල කළමනාකරණය සඳහා වෙන්වූ ආයතනයක් ස්ථාපිත කිරීම.	අපද්‍රව්‍ය කළමනාකරණ ප්‍රතිපත්තිය යටතේ කළමනාකරණය කළ යුතු එක් අපද්‍රව්‍ය කාණ්ඩයක් වශයෙන් සායනික අපද්‍රව්‍ය හඳුනාගෙන ඇත. රෝහල්වල සායනික අපද්‍රව්‍ය බැහැර කිරීම පෞද්ගලික ආයතන තුනක් මඟින් සිදුකරනු ලැබේ. සායනික අපද්‍රව්‍ය කළමනාකරණය සිදුවන ආකාරය සම්බන්ධයෙන් මධ්‍යම පරිසර අධිකාරිය මඟින් ක්ෂේත්‍ර

		පරීක්ෂණ වාර්ෂිකව සිදු කරන අතර ඒ අනුව පරිසර ආරක්ෂණ බලපත්‍ර හා උපලේඛනගත අපද්‍රව්‍ය කළමනාකරණ බලපත්‍ර ලබාදීමේ ක්‍රියාවලිය සිදු කෙරේ. මෙම සායනික අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත ප්‍රගතිය නිරීක්ෂණය සඳහා ආකෘතියක් යොමු කර ඇති අතර ඉහත ප්‍රතිපත්තියට අදාළව හඳුනාගෙන ඇති කෙටි කාලීන, මධ්‍ය කාලීන, හා දිගු කාලීන ක්‍රියාකාරකම් වල ප්‍රගතිය කාර්තු වශයෙන් නිරීක්ෂණය කෙරේ. රාජ්‍ය ආයතන පුද්ගලික අංශය සමඟ අපද්‍රව්‍ය කළමනාකරණය සිදුකරන විට එම පුද්ගලික ආයතනවල අපද්‍රව්‍ය පරිහරණ කටයුතු පිළිබඳව අදාළ රාජ්‍ය ආයතනය හරහා ප්‍රගතිය වාර්තා කරනු ලැබේ.
15.	සායනික අපද්‍රව්‍ය දහනය කිරීමෙන් ඉතිරිවන අපද්‍රව්‍ය පළාත් පාලන ආයතන විසින් අපහරණය කිරීම.	අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පරිසර අමාත්‍යාංශයේ ලේකම්ගේ ප්‍රධානත්වයෙන් හා සියළුම පාර්ශවකාර ආයතන සහභාගීත්වයෙන් පවත්වනු ලබන ජාතික අධීක්ෂණ කමිටුවේදී සාකච්ඡා කරනු ලබයි. විශේෂයෙන් සෞඛ්‍ය ක්ෂේත්‍රයේ සායනික අපද්‍රව්‍ය කළමනාකරණයේදී මෙම කරුණු සැලකිල්ලට ගනු ලැබේ. කෙසේ වුව ද සමහර පළාත් පාලන ආයතන මෙම අපද්‍රව්‍ය අපහරණය සඳහා භාර නොගැනීමේ ගැටළුවක් පවතී. ප්‍රතිකාර කිරීමෙන් බැහැර කරන අපද්‍රව්‍ය රෝහල් වලින් ජීවානුහරණය කිරීමෙන් පසුව පළාත් පාලන ආයතනවලට අපහරණය සඳහා ලබාදෙන බව පිළිබඳව අවබෝධයක් නොමැති නිසා මෙසේ භාර නොගැනීම සිදුවේ. ඒ සඳහා අවශ්‍ය වන්නේ අදාළ පළාත් පාලන ආයතනවල බැහැර කිරීමේ ක්‍රියාවලියේ නිරතවන සේවකයන් දැනුවත් කිරීමකි. පවතින මූල්‍ය ප්‍රතිපාදන තත්ත්වය සැලකිල්ලට ගෙන අදාළ දැනුවත් කිරීමේ කටයුතු සිදු කිරීම සිදු කරනු ලැබේ.

වෛද්‍ය අනිල් ජාසිංහ
ලේකම්